# ථෙරවාදයේ හා මහායානයේ පැණෙන බුද්ධ සහ බෝධිසත්ව සංකල්ප පිළිබඳ විමසුමක්

**- කථිකාචාර්ය කිරම විමලතිස්ස හිමි**

බුදුරදුන් ජීවමානව වැඩ විසූ සමයේ බුදුදහමේ පැවති ඇතැම් ඉගැන්වීම් සම්බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂයක් පමණ ඉකුත්වත්ම වෙනස් වී ගිය අයුරු ශාසන ඉතිහාසය දෙස බලන විට පෙනීයයි. ශාසනය ආරම්භක සමයේ විමුක්තිය එකායන අරමුණ කොටගත් බ්‍රහ්මචර්යාවක් තිබූ නමුත් පසු කාලීනව එය ක්‍රමයෙන් වෙනස් වී විවිධ දාර්ශනික මතවාදයන් ගොඩනැගීමටත් ඒවා තහවුරු කිරීමටත් උත්සාහගත් අයුරක් දැකගත හැකිය. එහෙත් මේ තුළින් මූලික බෞද්ධ සිද්ධාන්ත වෙනස් නොවූ අතර යම් යම් විවාදාත්මක කරුණු විවරණය කිරීමට උත්සාහ කිරීම තුළින් විචිත්‍ර සම්ප්‍රදායයන් රාශියක් බිහිවීමට පසුබිම සකස් කෙරිණ.

බුදුරදුන් ජීවමාන සමයේදීම ශාසනය තුළ දැකගතහැකි වූ එවැනි සිද්ධීන් කිහිපයක් ත්‍රිපිටකය තුළ වාර්තා වී ඇත. මජ්ඣිමනිකායේ මහාතණ්හාසංඛය සූත්‍රයේ සඳහන් වන සාති භික්ෂුවගේ කථාව ද[1] පාචිත්තිය පාලියේ සඳහන්වන අරිට්ඨ ආදී භික්ෂූන්ගේ කථාවන්ද, දේවදත්ත භික්ෂුවගේ පංච වස්තුවද එයට නිදසුන් වේ.[2] මෙවැනි මති මතාන්තර ආශ්‍රයෙන් පශ්චාත්කාලීන මහායාන වැනි සමුප්‍රදායන් බිහිවීමට පසුබිම සැකසුණි. කිසිම ආගමක් විපර්යාසයන්ට පත් නොවී එකම ආකාරයෙන් පැවතිය යුතු යැයි සම්මතයක් නොමැත. ඕනෑම දර්ශනයක් සාමාජයක්

වෙත ගෙන යෑමේ දී එහි ඇති ආගමික සංකල්ප ඉතා වැදගත් වේ. කල් ගත වන විට ආගමේ දාර්ශනික සංකල්ප යටපත් වී ආගමික සිද්ධාන්තවලට මූලිකත්වයක් ලැබෙන්නේ ය. මෙය බොහෝ ආගම්වලට පොදු ධර්මතාවකි. බොහෝවිට මෙය සිදුවන්නේ මිනිසුන්ගේ මානුෂීය අවශ්‍යතා සඳහා පුද පූජා වැනි භක්තිය මුල්කරගත් ආගමික සිද්ධාන්ත ප්‍රමුඛත්වයට පත්වීම තුළිනි. ඒ පිළිබඳව විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් බැලීම නිසා විවිධ දාර්ශනික සංකල්ප බිහි වේ. මුල් බුදුසමය දෙස බැලීමේ දී ආගමික හා දාර්ශනික පැති වෙනවෙනම හඳුනාගැනීම පහසුය. පසුකාලීනව බුදුසසුන තුළ බිහි වූ ජනප්‍රියම සම්ප්‍රදායයන් දෙක වශයෙන් සැලකිය හැකි ථෙරවාදය හා මහායානය බිහිවන්නේ මෙසේ මුල් බුදුදහම විග්‍රහ කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස යැයි කිව හැකිය. ථෙරවාදීන්ට වඩා භක්තිය මුල්කරගත් ඉගැන්වීම් රාශියක් මහායාන සම්ප්‍රදාය තුළ පෝෂණය විය. බුද්ධ හා බෝධිසත්ව සංකල්ප ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

ථෙරවාදීහු බුදුරදුන් උතුම් මනුෂ්‍යයෙකු ලෙස පිළිගනිති. එහෙත් මනුෂ්‍යත්වය ඉක්ම වූ අතිමානුෂීය පුද්ගලයෙකු ලෙස නොපිළිගනිති. ඔවුන්ගේ අදහසට අනුව බුදුරදහු මනුෂ්‍යයකු ලෙස ඉපදී මිනිසුන් අතර උත්තරීතර පදවිය වන බුදු පදවියට පත්ව මිනිසෙකු ලෙසම ජීවිතයේ අවසාන කාලය ගත කොට පිරිනිවි සේක. එහෙත් බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ කිහිපයක් ගතවන විට දී බුදුරදුන් පිළිබඳව මෙන්ම ධර්මය හා රහතන් වහන්සේ පිළිබඳව නොයෙක් මතභේද හටගත්තේය. විශේෂයෙන් බුදුරදුන් මනුෂ්‍යත්වය ඉක්මවූ අතිමානුෂීය පුද්ගලයෙකු ලෙස සැළකීමට ඇතමුන් පෙළඹුණ අතර එසේම උන්වහන්සේ සදාකාලික බවද ප්‍රකාශ කෙරිණ. මුල් බුදුසමයට අනුව කෙලෙස් නිවීම අතින් 'රහත්' බව හා 'බුදු' බව අතර වෙනසක් නොමැත. එහෙත් පසුකාලීනව රහත් බවෙන් කෙලෙස් සංසිඳීම පිළිබඳව බොහෝ දෙනෙක් සෑහීමකට පත්නොවූහ. එය මතභේදයට ද හේතු විය. ඒ නිසා 'බෝධිසත්ව' සංකල්පය වෙතට ඔවුහු නැඹුරුවූහ.



## බෝධිසත්ව සංකල්පය

'බෝධිසත්ව' යන්න බුදුදහමේ වැදගත් භූමිකාවකි. බුද්ධත්වය සඳහා පෙරුම් පුරණ බුද්ධාංකුරයා බෝධිසත්ව නාමයෙන් හැඳින් වේ. ඔහු ජාති ජරා ආදී දුක්වලින් පීඩිතව සසර සැරි සැරීම ගැන කලකිරී එයින් මිදීම සඳහා පාපයෙන් වෙන්වී කුසල් දහම් වඩමින් බුද්ධත්වය තුළින් නිර්වාණයට අවශ්‍ය පාරමිතා සම්පූර්ණ කරමින් සසර සැරිසරන තැනැත්තෙකි. මුල් බුදුසමයේ බෝධිසත්ව යන්න එතරම් හුවා දැක්වීමක් නැතත් මහායාන බුදුසමයේ විකාශයත් සමගම එයට වැඩි ප්‍රසිද්ධියක් ලැබුණි. ඒ අනුව බුද්ධත්වයට පමණක් දෙවනි වන්නා වූ බෝධිසත්ව සංකල්පය මහායානයේ ප්‍රධාන සංකල්පයක් බවට පත් විය.

මෙම විශේෂත්වය නිසාම මෙම වචනය ද නොයෙක් අයුරින් අර්ථකථනය කිරීමට උත්සාහ ගත් අයුරු දැකගත හැකිය. ජාතක අටුවා ගැටපදයේ එය විග්‍රහ කර තිබෙන්නේ මෙසේය. ''චතුර්විධ මාර්ග ඥානය ද සර්වඥතා මාර්ග ඥානය ද බෝධි නම් වෙයි. එහි ඇලුණු බැවින්ද බුදුරදුන් කෙරෙහි ලත් ව්‍යාකරණ ඇති බැවින්ද එකැත්තෙන් බුජ්ඣනක සත්ත්ව යයිද බෝධිසත්ත්ව නම්[3]'' මෙහිදී 'බෝධි' ශබ්දයෙන් මාර්ග ඥානය හා සර්වඥතා ඥානය ගෙන ඇත. 'සත්ත්ව' යන්න සක්ත, සත්භාව හා සත්ත්ව යන අර්ථ තුනද සඳහා යොදා තිබේ. එහෙත් මෙහි දී පැරණි අර්ථය හා ප්‍රධාන අර්ථය වශයෙන් ගැනෙන අදහස නම් 'සත්තාර්ථ'යයි. (ඇළුණු) බෝධියා+සත්තො=බෝධිසත්තො[4] යනුවෙන් පපංචසූදනී අටුවාවේ විස්තර කර තිබේ. ''බොධෞ ඥානෙ සාත්වාං අභිප්‍රායො ස්තීති බෝධිසත්ත්වඃ'' යනුවෙන් බෝධිචර්යා පංචිකාවෙහි ද ඉහත අදහසට සමාන අර්ථයක් දක්වා තිබේ.[5] මෙමගින් අදහස් වන්නේ බුදු බව හෝ එය අපේක්ෂා කරන තැනැත්තා යන්නය. බෞද්ධ විශ්ව කෝෂයේ (Encyclopedia of Buddhism) මෙයට අර්ථ දක්වා ඇත්තේ මෙසේය.

"බෝධි යන්න √බුධ ධාතුවෙන් සැදී ඇත. එහි අර්ථය 'අවබෝධය' යන්න හෝ 'අවබෝධයට පත්වීම' යන්න ය. 'සත්ත' යන්න සැදෙන්නේ 'සත්ත්' යන්නෙනි. එහි අදහස සත්වයා යන්නය. තවද ප්‍රාණවාචී සත්වයෙකු මෙයින් අදහස් කෙරේ. පද දෙකෙහිම අර්ථය අවබෝධය සඳහා යමෙකු තුළ ඇති හරය යන්නය. පාලි වචනය සැදෙන්නේ 'බෝධි' හා 'සත්ත' යනුවෙනි. අවබෝධය ලබා ගැනීමට සම්බන්ධ වී සිටින්නා යන අර්ථය එයින් ගෙන දේ. ථෙරවාද පාලි සාහිත්‍යයේ 'බෝධිසත්ත' යන වචනය බහුල වශයෙන් යොදාගෙන ඇත්තේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වයට පෙර අවස්ථාව සඳහන් කිරීමටය. බෝධිසත්ව සංකල්පය හා චක්‍ර වර්ති සංකල්පය බුදුන් වහන්සේ පහළවීමටත් පෙර ඉන්දියාවේ පැතිරී තිබුණි."[6] විමුක්තිය අපේක්ෂා කරන හැම දෙනාටම මෙම වචනය ගැලපෙන නමුත් සාමාන්‍යයෙන් මෙය යොදන්නේ බුද්ධත්වය අපේක්ෂා කරන්නවුන්ට පමණි. එහෙත් බුදු බව සුවිශේෂ භාග්‍ය සම්පන්න පිරිසකට වෙන් කළ දෙයක් නොවන හෙයින් සියලු දෙනාම බෝධි සත්වවරු වෙති.[7]

## ථෙරවාද ත්‍රිපිටකයේ සඳහන්වන බෝධිසත්ව සංකල්පය

බුද්ධත්වය ප්‍රාර්ථනා කර ඒ සඳහා අවශ්‍ය පාරමිතා සම්පූර්ණ කරන තැනැත්තා 'බෝධිසත්ව' යනුවෙන් හැඳින්වෙයි. ථෙරවාදයට අනුව මුල් බුදුදහම ආරක්ෂා වී තිබෙන්නේ ඔවුන්ට අයත් පාලි ත්‍රිපිටකයේය. බුද්ධ කාලයත් සමගම අඛණ්ඩව පැවතෙන පුරාණතම දහම් කොටස් සුරැකී ඇත්තේ ථෙරවාදයේ බව බොහෝ දෙනෙක් පිළිගනිති. ථෙරවාදයේ සඳහන් වන පරිදි නිර්වාණය ලබා ගැනීම සඳහා ත්‍රිවිධ බෝධියක් දක්වා ඇත. බුදු, පසේබුදු, මහරහත් යනු එම ත්‍රිවිධ බෝධියයි. මෙම තුනෙන් කවර හෝ තත්වයකට පත්ව කෙලෙස් සන්සිඳවා ගැනීම ථෙරවාදීන්ට අනුව ප්‍රාමාණිකත්වයෙන් සලකනු ලැබේ. ථෙරවාද සම්ප්‍රදායට අනුව බෝධිසත්ව ගැණෙනුයේ සිව්වැනි තැනටය.



එහෙත් මහායානිකයන්ට අනුව බෝධිසත්ව දෙවැනි වන්නේ බුදුරදුන්ට පමණි. කෙසේ හෝ මෙම සම්ප්‍රදායයන් දෙකම බුද්ධත්වයට පෙරුම් පුරණ බුද්ධාංකුර වශයෙන් බෝධිසත්වයන් පිළිගනී.

බුදුරදුන් ජීවමාන සමයේ දේශනා කරන ලද සූත්‍ර විශාල ප්‍රමාණයක බුද්ධතවයට පෙර එනම් අනභිසම්බුද්ධ බෝසත් අවස්ථාවේ දී උන්වහන්සේට සිතුන නොයෙක් කරුණු ගැන සඳහන් වේ.[8] එහි දී බොහෝ විට සඳහන් වන්නේ මේ භවයේ එහෙත් බුද්ධත්වය ලැබීමට පෙර තත්වය බෝධිසත්ව වශයෙනි. දිඝනිකායේ මහාපදාන සූත්‍රයේ දී විපස්සි ආදී සත් බුදුවරයින්ගේ ජාති, ගෝත්‍ර සඳහන් කිරීමේ දී බෝධිසත්වයෙක් තුසිත දිව්‍යලෝකයෙන් චුත වී මිනිස් මවකගේ කුසේ පිළිසිඳගෙන මේ ලෝකයේ පහළ වන අවස්ථාවන් හී දී සිදු වන 'ධම්ම නියාම' ගැන පැහැදිලි කරන තැන බෝධිසත්ත්වයන් ගැන ද සඳහන් කර තිබේ.

මහබෝසත්හු තුසී දෙව්ලොවින් චුත වී සිහි නුවණැතිව මවු කුස පිළිසිඳ ගනී. මෙය ධම්මතා ය.[9]

ඒ බෝසත්හු මව කුස පිළිසිඳගත් කල ඔහුට ද ඔහු මවට ද රැකවලට සිව්වරම් දෙව්රජහු සිව්දිගැ සිටිති. මෙය ද දහම් නියමයෙකි.[10]

බෝධිසත්වයන් පිළිබඳව හා බුද්ධත්‍වය ලබාගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු ගුණ ධර්ම පිළිබඳව විස්තරාත්මකව සඳහන්වන ථෙරවාද ග්‍රන්ථයකි බුද්දකනිකායට අයත් 'බුද්ධවංස' ය. එහි දී බුද්ධත්‍වය සඳහා බෝධිසත්වයෙකු විසින් සම්පූර්ණ කළ යුතු 'බුද්ධ කාරක' ධර්ම පිළිබඳව පැහැදිලි කර ඇත. ගෞතම බුදුරජාණන් වහන්සේ සුමේධ නමින් සිට දීපංකර බුදුරදුන්ගෙන් නියත විවරණ ලැබීමෙන් පසු බුද්ධත්‍වය සඳහා පාරමී පිරීම ආරම්භ කළ බව ථෙරවාදයේ පිළිගැනීමයි.

එහි දී කලල් මත වැතිර සිටි සුමේධ තවුස්තුමා දක්වමින් දීපංකර බුදුරජාණන් වහන්සේ ජටාධර වූ උග්‍ර තපස් ඇති මේ තවුසා බලන්න මෙයින් අප්‍රමේය වූ කල්පයේ ලොව බුදුවෙයි.[11] යනුවෙන් නියත විවරණ දී තිබේ. බෝධිසත්ව වරයෙකු වනුයේ අප්‍රමාණව සසරදුක් විඳින සත්වයන් සඳහා පැතුරුණු මහාකරුණාව ඇති එසේම ඔවුන් සසරින් මිදවීම සඳහා මහා ප්‍රඥාවක්ද ඇති කල්හි ය. බුද්ධත්‍වය සඳහා නියත විවරණ ලැබීමට නම් කරුණු අටක් සම්පූර්ණ විය යුතු බව බුද්ධ වංශයේ සඳහන් වේ.

1. මනුෂ්‍යත්වයක් ලබාගෙන සිටීම
2. ලිඞග සම්පත්තිය (පුරුෂ බවින් යුතු වීම ලෙස අටුවාව විස්තර කරයි)
3. රහත් බව ලැබීමට හේතු සම්පත් තිබිය යුතුය
4. ජීවමාන ශාස්තෘන් වහන්සේ දැකීම
5. පැවිදිව සිටීම
6. අෂ්ට සමාපත්ති ආදී ගුණ විශේෂයකට පැමිණ සිටීම
7. ජීවිත පරිත්‍යාග කිරීමේ කැමැත්ත
8. බුද්ධ කාරක ධර්ම වැඩීමේ කැමැත්ත[12]

මෙකී අංග අට සම්පූර්ණ වූ කල්හි බුදු කෙනෙකුගේ හමුවෙහි බෝධිසත්වවරයෙකුගේ නියත විවරණ ගැනීම සිදු වේ. බුද්ධත්වය සඳහා සිතින් ප්‍රාර්ථනා කිරීම මනෝප්‍රණිධිය ලෙසත් වචනයෙන් ප්‍රාර්ථනා කිරීම වාක් ප්‍රණිධිය ලෙසත් බුදුකෙනෙකුගෙන් එම බුදුවීමේ ප්‍රාර්ථනාව ස්ථිරවම සිදුවන බව ප්‍රකාශ වීම නියත විවරණ ලැබීම ලෙසත් හැඳින් වේ. එතැන් පටන් ඔහු බුද්ධත්වය සඳහා පාරමී පුරණ බුද්ධාංකුර ලෙසින් හැඳින්වෙයි. සුමේධ තාපසයන් මතු බුදු වන බවත් මේ නම්



ගොත් වන බවත්, මේ මේ නම් ඇති අය මවුපියන්, අග්‍රශ්‍රාවක ශ්‍රාවිකාවන් වශයෙන් හැඳින්වෙන බවත් දීපංකර බුදුරදුන්ගෙන් අසා දැනගත් දෙව් මිනිසුන් ප්‍රීතියෙන් ඔදවැඩී ගිය බව බුද්ධවංශයේ සඳහන් වේ.[13] ථෙරවාද සම්ප්‍රදායට අනුව බෝධිසත්වයෙකු වශයෙන් හැඳින්වෙන්නේ රහත් භාවය සඳහා හේතු සම්පත් ඇති උතුමෙකි. ඔහු සසර සත්වයන් ගැන සළකා ඔවුන් කෙරෙහි කරුණාවෙන් නිර්වාණය අතහැර තවදුරටත් ජරා මරණ දුකට මුහුණ දේ. එසේ සසරට පිවිසෙන බෝධිසත්වයෙකු බුද්ධත්‍වය උදෙසා පාරමිතා දහයක් සම්පූර්ණ කළ යුතු ය. එනම් දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්ය, ශාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්‍ෂා යනුවෙනි. චර්යාපිටකයේ හා ජාතක පාලියේ දී බෝසතුන් සත්වයාට කරුණාවෙන් හා ප්‍රඥාවෙන් සෙත සලසමින් පාරමී සම්පූර්ණ කළ ආකාරය කථා ආශ්‍රයෙන් විස්තර කර තිබේ. බෝධි සත්වයෙකු දස පාරමී සම්පූර්ණ කිරීමේ දී පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී වශයෙන් ඒවා පිරිය යුතුය. එමගින් බුද්ධත්‍වය උදෙසා බෝධිසත්වයෙකු කැපවෙන ආකාරය සිතා ගත හැකිය. බුදුරදුන් 'බුද්ධවංස' දේශනාව පැවැත් වීමට හේතුව ද සැරියුත් හිමියන් මෙසේ පාරමිතා සම්පූර්ණ කිරීම පිළිබඳව අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමක් වශයෙනි.[14]

1. දාන පාරමී - දාන පාරමිතාව නම් ශරීර අංග පරිත්‍යාගය දක්වා කෙරෙන දන් දීමයි

   (තදත්ථ දානපාරමියං තාව අඞ්ගපරිච්චාගො පාරමී නාම)

2. දාන උප පාරමී - බාහිර වස්තු පරිත්‍යාග කිරීම දාන උපපාරමිතාවයි

   (බාහිරභණ්ඩපරිච්චාගො උපපාරමී නාම)

3. දානපරමත්ථපාරමී - ජීවිත පරිත්‍යාග දානය පරමත්ථ පාරමිතා නම් වේ.

   (ජීවිතපරිච්චාගො පරමත්ථ පාරමී නාම)

මේ ආකාරයට සෙසු පාරමිතා ද සම්පූර්ණ කළ යුතුය. මෙසේ පාරමී සම්පූර්ණ කර අවසානයේ දී තව්තිසාවට ගොස් එහි වාසය කරමින් සිටින විට මිනිස් ලොව ඉපදීම සඳහා දෙවියෝ ආරාධනා කරති. අවසානයේ පස්මහ බැලුම් බලා මිනිස් ලොව ඉපදීමට සිතයි. අනතුරුව බෝධිසත්ව මාතාවගේ කුසේ පිළිසිඳ ගැනීමේ සිට සිදුවන සිදුවීම් ආශ්චර්යවත් ලෙස මහාපදාන සූත්‍රයේ විස්තර කර තිබේ.[15] ථෙරවාද මෙන්ම අනෙක් නිකායිකයන්ගේ ධර්ම ග්‍රන්ථ පිළිබඳව හරවත් විශ්ලේෂණයක යෙදුණු ඊ.ජේ. තෝමස් මහතා ස්වකීය The History of Buddhist Thought නැමති ග්‍රන්ථයේ දී මෙසේ සඳහන් කර තිබේ.

"බුද්ධත්වය ලැබීමට ඒකාන්ත වූවෙකු හැටියට බෝධිසත්ත්වයෙකු පිළිබඳ අදහස කෙසේ ඇතිවී දැයි කීමට තරම් බුද්ධ ධර්මයට සම්බන්ධ වූ ප්‍රමාණවත් ඓතිහාසික පසුබිමක් ගැන අපි නොදනිමු. පුනරුප්පත්තිය පිළිබඳ ඇදහීමක් සමගම බෞද්ධයන් අතර යථෝක්ත අදහස නිදහස්ව ඇති වී යැයි සිතිය හැක. බුද්ධත්වය ලබාගණු පිණිස ගුණ ධර්ම හයක් හෝ දහයක් සම්පූර්ණ කරන තැනැත්තෙකු වශයෙන් පිළියෙළ වූ බෝධිසත්ව ධර්මය වූ කලී ඒකාන්තයෙන් ත්‍රිපිටකයෙන් වැඩි කොටසක් පිළියෙළ වූවාට පසු ඇති වූ ධර්මයෙකි. පාපකාරී පුද්ගලයාගේ සිට සම්‍යක් සම්බුද්ධයන් දක්වා වෙසෙන සියලු දෙනාගේ වෙනස් වෙනස් චරිතයන් විස්තර කරන අභිධර්ම කෘතියක් වූ පුග්ගලපඤ්ඤත්තියේ පවා බෝධිසත්වයා ගැන සඳහන් නොකෙරෙයි... ඒ පිළිබඳව සඳහන් වන්නේ ත්‍රිපිටකයේ ඉතා මෑත කාලයේ රචනා වූ ග්‍රන්ථයක් වන බුද්ධවංශයේ ය..."[16]

## මහායාන බෝධි සත්ත්ව සංකල්පය

මහායාන බෝධිසත්ව සංකල්පය ගොඩ නැගෙන්නේ ථෙරවාදයට වඩා හාත්පසින්ම වෙනස් ආකාරයකිනි. බුද්ධත්වයට පෙරුම් පුරන බුද්ධාංකුරයෙකු වශයෙන් ථෙරවාදීන් බෝසත්වරුන් සඳහා ගෞරවයක් දැක්වූවත් ඉන් එහා



විශේෂත්වයක් දක්වා නොමැත. ථෙරවාදය තුළ සියලු දෙනාම බුද්ධත්වයෙන් නිර්වාණාවබෝධය ලැබීම අපෙක්‍ෂා නොකරන අතර රහත් භාවයෙන් හෝ විමුක්තිය ලැබීම උසස් කොට සළකා තිබේ. එහෙත් මහායානිකයෝ රහත් භාවයෙන් නිර්වාණය ප්‍රාර්ථනා කිරීම ආත්මාර්ථකාමී හැඟීමක් ලෙස සළකති. එම නිසා රහතන් වහන්සේට මහායානයේ දී ලැබෙනුයේ පහත් ස්ථානයකි. බුද්ධත්වයෙන් නිවන ලැබීම මහායාන ඉගැන්වීම් වල ප්‍රධානතම සිද්ධාන්තයයි. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන සියල්ලෝම බෝධිසත්වවරයෝය. රහත්බවට පැමිණීම දුෂ්කර කාර්යයක් වශයෙන් මහායානිකයන් සළකන අතර බෝධිසත්ව භූමිය එතරම් දුෂ්කර නොවේ.[17]

සමස්ත ජනතාවගේ යහපත උදෙසා හැම කෙනෙක්ම වැඩ කළ යුතුය. එසේ වැඩ කිරීමෙන් ලැබෙන පින සියල්ලන්ටම අනුමෝදන් කළ යුතුය. පැවිද්දේ පරමාර්ථය තමන් පමණක් දුක් දුරු කිරීමෙන් සැනසීම නොවේ. බෝසත් බවට පැමිණ සියල්ලන්ගේ දුක් දුරු කිරීමට වැඩ කළ යුතුය. එම බෝසත් බවට පැමිණ ලබන බුදු බව අලෞකික තත්වයක් බවද ඒ අලෞකික තත්වය නිසා බුද්ධකාය සදාතන බවද දැක්වීය.[18]

මෙම බෝධිසත්ව අදහස කවදා ආරම්භ වූයේ දැයි නිශ්චිතව කිව නොහැකි නුමුදු සමහර විට එය ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ පමණ ආරම්භ වන්නට ඇතැයි බොහෝ දෙනාගේ මතයයි.[19] මෙම මතය ශීඝ්‍රලෙස ව්‍යාප්ත වූයේ සිව්වෙනි ධර්ම සංගායනාවෙන් පසුවය. මහායානයේ බෝධිසත්ව සංකල්පය සද්ධර්මපුණ්ඩරීක හා දශභූමික සූත්‍ර වලදී විස්තර කර තිබේ.

## මහායාන බෝධිසත්ව සංකල්පය ඇතිවීම කෙරෙහි බලපෑ හේතු

මහායාන බෝධිසත්ව සංකල්පය බිහිවීම කෙරෙහි සමකාලීන ඉන්දියාවේ සමාජ පසුබිම ද බලපෑවේය. මේ වන විට ඉන්දියාවේ බිහි වූ ශ්‍රේෂ්ඨතම බෞද්ධ හිතකර මෞර්ය රාජ්‍යයේ

බලය අවසන් වී බ්‍රාහ්මණ හිතකර සුංගරාජ පාලනය ආරම්භ වී තිබුණි. (ක්‍රි.පූ 187-73) එසේම සමකාලීන භාරතයේ භාගවත, ශෛව, ආදී හින්දු ආගමවල ව්‍යාප්තිය ද සිදුවෙමින් පැවැතිණි. මහායානයේ ආරම්භයේදීම බෝධිසත්ව අදහස නොපැමිණයේය. එහෙත් භක්ති මාර්ගය සහ විඥානවාදය බෝධිස්ත්ව සංකල්පය බිහිවීමට හේතු වූ කරුණු අතර ප්‍රධාන වේ. බුද්ධාගම ඥාන මාර්ගයෙන් ආරම්භ වූ අතර මහායානය නිසා එය භක්ති මාර්ගයට හැරුණේය. භක්තිය දියුණු කිරීම ඥානය ලැබීමේ උපාය හැටියට සලකන ලදි. හින්දු ආගමේ බලපෑම ද භක්ති මාර්ගය වැඩීම සඳහා හේතු විය. භගවත්ගීතාව වැනි භක්තියම දියුණු කිරීම අවධාරණය කරන ග්‍රන්ථ මහායාන බුදුදහම කෙරෙහි තදින්ම බලපෑවේය. මෙම බෝධිසත්ව අදහස ඇති වූ යුගයේ ඉන්දියාවේ බලවත්ම ආගම හින්දු ආගම විය. එම නිසා ඔවුන්ගේ භක්ති මාර්ගය වැනි බොහෝ කරුණු බුද්ධාගමට ඇතුළු විය. භක්ති මාර්ගය කෙතරම් දියුණු වූයේ ද කිව හොත් බුදුන් සළකන ලද්දේ ක්‍රිෂ්ණ භක්තිකයන් විෂ්ණු අදහන අයුරිනි. එබැවින් හින්දූන්ගේ භගවත්ගීතාව හා සමානව භක්තිය දියුණු කරන සද්ධර්මපුණ්ඩරීකය වැනි පොත්ද සම්පාදනය කෙරිණ. භක්තිය මුල් වූ ආගමක නානා පුද පූජාවන් හට ගැනීම ද එබඳු වූ අනෙකුත් ආගම් වල පුද සිරිත් අනුගමනය කිරීම ද වැළැක්විය නොහැකිය. මේ නිසා බෞද්ධයෝ හින්දූන්ගේ බොහෝ අදහස් අනුගමනය කළහ. මෙහි ප්‍රතිඵලය වූයේ බුදුන් දේවත්වයෙන් සළකන්නට පුරුදු වීමත් තමනුත් එතැනට පැමිණීමට උත්සාහ කිරීමත්ය. මහාබලස්ථානයට පැමිණි මහා බ්‍රහ්මයා මෙන් බුදුනුදු එහි පැමිණි බවත් තමනුත් එතැනට පැමිණෙන බවත් කීහ. එයින් තමන් බෝධිසත්වවරයෝ ය යන අදහස ඇති කර ගත්හ.[20]

මේ අනුව හින්දු දෙවිවරුන් මෙන් බෝසත්වරුන් අදහන්නට පුරුදු වීම හා බුදුන් වහන්සේලාට පමණක් පිහිටන ලෝකෝත්තර ගුණ බෝධිසත්ව වරයන් කෙරෙහි ආරෝපණය කිරීම ද පර්සියානු සභ්‍යත්වයේ සහ ග්‍රීක සංස්කෘතියේ බලපෑම ද බෝධිසත්ව වාදයේ විකාශය කෙරෙහි බලපා ඇති බව



පෙනීයයි. එසේම බෝධිසත්වවරයන්ගේ ශ්‍රේෂ්ඨත්වය විදහාලමින් ලියූ මහාවස්තුව සහ භක්ති මාර්ගය වර්ණනා කරමින් ලියූ සද්ධර්මපුණ්ඩරීකය වැනි මහායානිකයන්ගේ ග්‍රන්ථ ද ඒ අනුසාරයෙන්ම ලියන ලදැයි සළකන බුද්ධවංසය නැමැති කෘතිය නිසා ද තව තවත් එය පැතිරී ගියේ ය.[21]

## මහායාන බෝසත්වරු

බුද්ධත්වය ලබා ගැනීමට නම් බෝධිචර්යාවතාරයේ සඳහන් පරිදි භක්ති මාර්ගය අනුගමනය කළ යුතු අතර ඒ තුළින් බෝධිචිත්තය උපදවා බෝධිසත්ව තත්වයට පත්විය යුතුය. බෝධිචිත්තය දෙයාකාරය. බෝධිය පිණිස පිහිටුවා ගන්නා සිත 'බෝධි ප්‍රණිධි චිත්ත' ද 'බෝධි ප්‍රස්තාන චිත්ත' ද වශයෙනි.[22] බෝධි ප්‍රස්තාන චිත්තය ගමනක් යාම වැනි යයි ද බෝධි ප්‍රණිධි සිත ගමනක් යෑමට සිතීමක් වැනි යැයි ද උපමාකර තිබේ. මහායානයට අනුව දෙයාකාර වූ බෝධි චිත්තනය උපදවා ගැනීමට ක්‍රමානුකුල වැඩ පිළිවෙළක් ඇත. ඒ සඳහා අනුත්තර පූජාවිධි නමින් යුත් සප්තවිධ පිළිවෙතක් ඇත. වන්දන, පූජන, බුද්ධ යාචන, පාප දේශන, පුණ්‍යානුමෝදන, බුද්ධාන්ධ්‍යෂණ, බෝධි පරිණාමන වශයෙනි. 'මම බුදු වෙමි'යි අදහස පිහිටුවා ගැනීම බෝධි චිත්තය නම් වේ. බෝධි ප්‍රණිධි සිත අතිශයින් දුෂ්කර වූවක් වශයෙන් දක්වා තිබේ. නමුත් එය ඉතා ශ්‍රෙෂ්ඨ වේ. කේවල ඥානය ලබා ගැනීම පිණිස බුදුවීමට හැකි ව්‍රතයන් සමාදන්ව කර්මයන් ක්‍ෂය කරමින් පෙරටුව යෑමේ සිත බෝධි ප්‍රස්තාන චිත්තයයි. සෑම සත්වයෙකු තුළම බුද්ධ බීජ තිබේ. බෝධිසත්ව පරමාර්ථයෙන් කරන්නේ එය සංවර්ධනය කිරීමය. සෑම මහායානිකයෙකුගේම පරමාර්ථය බුදු වීමයි. බුදු වූවාට පසු එම තථාගතයන්ගේ කාර්යය සෙස්සන් බුදු බව පිණිස යොමු කිරීමයි.

බුදුධත්වය සඳහා ථෙරවාදයේ දස පාරමී සම්පූර්ණ කළ යුතු වුවත් මහායානයේ ඇත්තේ පාරමී හයකි. දාන, ශිල, ක්‍ෂාන්ති,

වීර්ය, ධ්‍යාන, ප්‍රඥා වශයෙනි. තව ද දශ භූමි නමින් හැඳින්වෙන උතුම් ගුණ දහම් ඇති කරගත යුතුය. එවා නම් ප්‍රමුදිතා, විමලා, ප්‍රභාකරී, අර්චිස්මතී, සුදුර්ජයා, අභිමුඛී, දූරංගමා, අචලා, සාධුමති, ධර්ම මේඝා යන දහයයි. මෙය පුද්ගලයෙකු ලබන එක්තරා තත්ව සමූහයකි. එකිනෙකින් උසස්වන තත්වයට මේවා ගොනු කර තිබේ. මෙකී දස භූමි, අනුත්තර පූජා විධි හා ෂට් පාරමිතා පිළිබඳ ගවේශනය අවසන් කිරීමෙන් බුද්ධත්‍වය ලබති.

බෝධිසත්වවරයින් ලක්‍ෂ ගණනක් වැඩ සිටින බව දක්වා ඇති අතර ඒ අතරින් පුරුෂ ධෛර්යයෙන් හා උත්තරීතර ගුණයෙන් සමන්විත අයගේ ගණන අල්පය. එබඳු බෝසතුන් අටදෙනෙක් ඇත. අවලෝකිතේශ්වර, ආකාශගර්භ, වජ්‍රගර්භ, ක්‍ෂිතිගර්භ, සර්වනිවාරණ, **විෂ්කම්බින්**, සමන්තභද්‍ර, මංජු ශ්‍රී, යන අට දෙනාය.[23] මෙම බෝධිසත්ව වරයන් අටදෙනා ධ්‍යානි බෝධිසත්ව නමින් හැඳින්වෙයි. මේ සෑම දෙනාටම මුද්‍රාවක් ද සංකේතයක් ද වාහනයක් ද ඇත.[24] හින්දු ආගමික විවිධ දෙවි දේවතාවරුන් බුදුසමයට අභියෝගයක්ව පවතිද් දී එයට පිළිතුරු සැපයීම සඳහා බෞද්ධ දාර්ශනිකයෝ බෝධිසත්වවරුන් හා බුදුවරුන් මාධ්‍ය කොට ගත්හ. ඒ නිසා හින්දූන් හින්දු දෙවිවරුන් මෙන් බෞද්ධයෝ ද ඔවුන් තමන්ගේ ගැලවුම් කරුවන් ලෙස සලකන්නට පුරුදු වූහ. ක්‍රි.ව. 4-5 සියවස් වලින් පසුව බෝධිසත්ව පූජාව, බෝධිසත්ව ඇදහීම බුදුන් පිදීමටත් වඩා පුළුල් වී ගියේ ය. දශභූමි සූත්‍රය හා සද්ධර්මපුණ්ඩරීක යන සූත්‍ර වලින් ඔවුන් ඇදහීම ඕනෑම අදහසක් සඵල කරගැනීමට තුඩු දෙන්නක් හැටියට ද දක්වා ඇත. හින්දු දෙවියන්ට සමාන බලතල ද ඔවුන් වෙත පවරා තිබේ.[25]

## බුද්ධ සංකල්පය

ක්‍රි.පූ හයවැනි සියවසේ භාරතයේ පහළ වූ සිද්ධාර්ථ ගෞතම නැමති අද්විතීය පුරුෂයා පළිබඳව හා එතුමා විසින් අවබෝධ කරගත් බුද්ධත්වය නැමති උතුම් මානසික තත්‍වය පිළිබඳව අද ද



බොහෝ දෙනා විශ්මය සහිතව කතා කරති. මන්ද යත් උන්වහන්සේ තවත් එක් ආගමික නායකයෙක් පමණක් නොවන නිසාය. පසුකාලීන උගතුන් බුද්ධත්වය පිළිබඳව ත්‍රිපිටකය හා තදනුබද්ධ මූලාශ්‍ර ඔස්සේ කරුණු අධ්‍යයනය කර ස්වකීය විඥාණ මට්ටම් අනුව විග්‍රහ කර තිබේ. එවා හුදෙක් භාෂාවන් යොදාගෙන කළ නිර්වචනයන් ය.

Encycopedia of Buddhism හි මෙම 'බුද්ධ' යන පදය විග්‍රහ කිරීමට උත්සාහගෙන තිබේ. බුද්ධ යනු සාමාන්‍ය නමකි. එහෙත් පොදු නමක් නොවේ. නමුත් මෙය භාවිත කළ හැක්කේ බුද්ධත්‍වයට පත්වූවෙකු සඳහා පමණි. සත්‍ය අවබෝධ කරගත් තැනැත්තා බුද්ධ නම් වේ. කර්ම කාරක අතීත කාල කෘදන්ත වචනයක් වන 'බුද්ධ' යන්න 'බුධ්' ධාතුවෙන් බිහිවූවකි. මෙහි අවදිවීම, අවබෝධ කොට ගැනීම, අධ්‍යයන කිරීම, තේරුම් ගැනීම වැනි අර්ථ රාශියක් ඇත. එසේම පාලි හා සංස්කෘත යන භාෂා දෙකේම සමානව මෙම පදය භාවිත වේ. චීන භාෂාවේ 'Fo' යනුවෙන් යෙදෙන අතර ජපන් භාෂාවේ Butsu, Butsuda, හෝ Hotoku යන පදයන් භාවිත වෙයි. නමුත් චීන භාෂාවේ Chiao - Chē ලෙස භාවිත වෙයි. ටිබෙටයේ එය Sang Rgyas වශයෙන් යෙදෙන අතර යුරෝපීය භාෂාවල 'බුද්ධ' යන්න සඳහා The Awakened, the Enlightened one වැනි වචන යොදාගෙන ඇති අයුරු දැකිය හැකිය. මුල් යුගයේ 'සම්මාසම්බුද්ධ' හා 'පච්චෙකබුද්ධ' යනුවෙන් බුදුවරුන් දෙදෙනෙකු ගැන පමණක් දැකගතහැකි වුවත් පාලි අටුවාවල සබ්බඤ්ඤු බුද්ධ, පච්චේක බුද්ධ, චතුසච්ච බුද්ධ හා බහුශ්‍රැත බුද්ධ යනුවෙන් සිව්දෙනෙක් පිළිබඳව සඳහන්වේ. සියලු උගත් මිනිසුන් බහුශ්‍රැත බුද්ධ නම් වන අතර චතුරාර්යය සත්‍ය අවබෝධකරගත් රහතන්වහන්සේලා චතුසච්ච බුද්ධ නම් වේ. අසංඛ්‍ය දෙකක් හා කල්ප ලක්‍ෂයක් දස පාරමිතා සම්පූර්ණ කළ අය පච්චේක බුද්ධ නම් වන අතර සාරාසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් පෙරුම් පිරූ අය සබ්බඤ්ඤු බුද්ධ නම් වේ. මහායාන සම්ප්‍රදායේ සඳහන් වන්නේ 'ආදි බුද්ධ' හා 'ධ්‍යානි බුද්ධ' යනුවෙනි.[26]

## ථෙරවාද ත්‍රිපිටකය තුළ නිරූපනය වන බුද්ධ සංකල්පය

බුදුදහමේ සංවර්ධනයත් සමගම 'බුදුරදුන්' තුළ පැවති බුද්ධ ඥානය විකාශය වී ගොස් මිනිස් වෙසෙන් පෙනී සිටින දේවත්‍වයකට අවරෝපණය විය. බොහෝ විට දේවවාදී ආගම් සමග ගැටීම නිසා (හින්දු) ඔවුන් හා තරඟ කිරීමට බුදුරදුන් තුළට ද දෙවත්වයක් ආරෝපණය කළා විය හැක. ඒ කෙසේ වුවද ථෙරවාද ත්‍රිපිටකයේ සඳහන් තොරතුරු වලින් පෙනී යන්නේ බුදුරදුන් මනුෂ්‍යත්වය ඉක්මවූ අරුම පුදුම පුද්ගලයෙකු ලෙස නොව උතුම් ශාස්තෘවරයෙකු ලෙසය. පටිසම්භිදාමග්ගයේ දී තමන් වහන්සේ අවබෝධයට පැමිණ විනේය ජනයන්ට ද අවබෝධ කරවන බැවින් බුද්ධ නම් වන බව දක්වා තිබේ.[27] මුල් බුදුසමයේ නිරූපණය වන ආකාරයට බුද්ධත්වය යනු මිනිසෙකු විසින් ලැබිය හැකි උත්තරීතරම පදවියයි. බුද්ධත්වයට පත් විය හැක්කේ මිනිසෙකුට පමණි. එසේම බුද්ධත්වය කිසිවෙකු විසිනුත් අවබෝධ කරවූවක් නොවේ. එය තමා විසින්ම දැඩි පරිශ්‍රමයකින් සොයා ගත යුත්තකි. මුල් සූත්‍ර දෙස බලන විට පෙනීයන්නේ බුදුරදුන් බුද්ධත්වයට පෙර කටයුතු කරන ලද්දේ නිවන පිළිබඳ කිසිත්ම අවබෝධයකින් තොරවය. ඒ සඳහා ගමන් කළයුතු පැහැදිලි මාර්ගයක් ද නොතිබුණේය. එහෙත් ගිහි ජීවිතයේ සිට පිරිසිදු බඹසරක් රැකිය නොහැකි බව අවබෝධ කරගෙන දෙමාපියන් හඬද්දීම යොවුන් වියෙහි සිටිත්ම කෙස් රැවුළු බහා පැවිදි විය.[28] ජීවිතය දුක්ගොඩකි. මෙහි නිවීමක් තිබිය යුතු යැයි වටහාගත් බෝධිසත්වයෝ මෙම නිවීම එකළ විසූ ප්‍රසිද්ධ ආචාර්යවරුන් වෙත ඇත්දැයි සොයා බැලූහ. ඒ අනුව ආලාරකාලාම හා උද්දකරාම යන ආචාර්යවරුන් වෙත ගිය එතුමා ඔවුන් සතු වූ ආකිඤ්චඤ්ඤායතනය හා නේවසඤ්ඤානාසඤ්ඤායතනය යන ලෞකික ධ්‍යාන උපදවා ගැනීමට සමත් විය. එහෙත් තමා සෙවූ නිවන ඔවුන් තුළ නොමැති බව වටහාගත් පසු එම ස්ථානවලින් නික්ම ගියේය.[29] අනතුරුව තමා සෙවූ නිවන කිසිවෙකු තුළත් නොමැති බව



වවටහාගත් පසු එකල දුකින් මිදීම සඳහා අනුගමනය කරන ප්‍රසිද්ධ පිළිවෙතක් වූ ශරීරයට දුක් දීම මෙතුමා ද අනුගමනය කළේය. එය අන්තගාමී ලෙසම අනුගමනය කොට මින් පෙර කිසිම මහණ බමුණෙක් නොකළ තරම් ශරීරයට දැඩි දුක් දුන්නේය.[30] එයින්ද ප්‍රතිඵලයක් නොලැබූ කල එයද නිවැරදි මාර්ගය නොවන බව වටහාගෙන ස්වකීය අත් දැකීම් ද ආශ්‍රයෙන් මැදුම් පිළිවෙතට අවතීර්ණව ශරීරය ක්‍රමයෙන් යහපත් අතට පමුණුවා ප්‍රථමධ්‍යාන ආදී ධ්‍යාන උපදවා අවසානයේ දී පුබ්බේනිවානුස්සති, චුතූපපාත යන පංච අභිඥාවන්ගේ කෙළවරට ගොස් අවසානයේ දී සියලු කෙලෙසුන්ගෙන් තොර වූ ආසවක්ඛය ඤාණය අවබෝධ කොට ගෙන කාමාශ්‍රව, භවාශ්‍රව, අවිද්‍යාශ්‍රව යන කෙලෙසුන්ගෙන් මිදී බුද්ධත්වය පැමිණියේය.[31] මජ්ඣිමනිකායේ අරියපරියේසන සූත්‍රයේ දී දක්වා ඇත්තේ ප්‍රකටව පෙණෙන ජරා මරණ දුක ඇති වන්නේ කෙසේ දැයි නුවණින් විමසීම තුළින් ක්‍රමයෙන් පටිච්චසමුප්පන්නව සිදුවන භවගමන අවබෝධ කරගත් ආකාරයයි.[32] ඒ තුළින් ප්‍රකට වන්නේ එතුමා විසින්ම ස්වකීය ඥානයෙන් නිවන සොයාගත් ආකාරයයි. එසේම පෙර නොඇසූ විරූ ධර්මයක් පිළිබඳව තමා විසින්ම විශේෂයෙන් අවබෝධ කර සාක්ෂාත් කරගත් ඥානයක් අනුව බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරන බව දක්වා තිබේ.[33] මේ අනුව පැහැදිලි වන්නේ සත්‍ය සොයාගත්තේ තමන් විසින්ම බවය. බුද්ධත්වය හා රහත් භව අතර ද අසාමාන්‍ය වෙනසක් නොමැත. කෙලෙස් නැති කිරීම අතින් බුද්ධත්වය හා රහත් භාවය සමානය. බුදුවරයෙකු වශයෙන් උන්වහන්සේ අනෙක් අයගෙන් වෙනස් වනුයේ ඥානය අවබෝධකරගත් ක්‍රමයෙනි. ගවේශකයා වශයෙනි. මජ්ඣිම නිකායේ දක්වා ඇත්තේ බුද්ධත්වය රහත් භාවයෙන් වෙන්වන්නේ භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙහි උත්පාදක බැවිනි. නොදත් මාර්ගය දත් තැනැත්තාය. එසේම නොදෙසූ මාර්ගය දෙසූ තැනැත්තාය.[34] බුදුරදුන් තමන් ත්‍රිවිද්‍යාධාරී බව ප්‍රකාශකර තිබේ.[35] ත්‍රිවිද්‍යා නම් පුබ්බේනිවාසානුස්සති, චුතූපපාත, ආසවක්ඛය යන ඥානයන්ය.

රහතන් වහන්සේලා ද මෙකී ඥානයන් ලබා ගනිති. ඒවා වෙනස් වන්නේ එකිනෙකාට සිහිකළ හැකි කාලයේ ප්‍රමාණය අනුවය. තව ද යම් යම් කරුණු අතින් බුද්ධත්වය හා රහත් භාවය සමාන වුවත් බුද්ධ ඥානය ගැන සැළකීමේ දී ඒ හා සමාන කළ හැකි නුවණක් ඇත්තෙකු සිට නොමැත. මජ්ඣිමනිකායේ ගෝපකමොග්ගල්ලාන සූත්‍රයේ දී ආනන්ද හිමියන් පවසන්නේ ඒ භගවත් අරහත් සම්බුදුවරයන් වහන්සේ යම් තථාගත ඥානයකින් සමන්විත ද ඒ ධර්මයන්ගෙන් සියල්ල හැම අයුරකින්ම දත් එකද භික්ෂු කෙනෙක් නැත්තාහ යනුවෙනි.[36] එසේම එම සූත්‍රයේ බුදුරදුන්ට විශේෂිත වූ 'දශබල'යක් ගැන ද සඳහන් වේ. මජ්ඣිමනිකායේ මහාසීහනාද සූත්‍රයේ දී බුදුරදුන්ගේ විශාරද භාවය ප්‍රකට කරනු සඳහා චතුර් වෛශාරද්‍ය ඥානය නමින් කරුණු හතරක් දක්වා තිබේ.

ත්‍රිපිටක සාහිත්‍යයේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතය රචනා වී ඇති ආකාරය බලනවිට දී පෙනී යන්නේ බෙහෙවින්ම ස්වාභාවික මිනිස් භාවයක් සහිත ශාස්තෘවරයෙක් ලෙසය. බුද්ධත්වය යනු මිනිස් මනස උසස් කළ හැකි ඉහළම තත්වයයි. ඒ උසස් බව නිසාම උන්වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකු වේ. අංගුත්තරනිකායේ ද්‍රෝණ සූත්‍රයේ දී බුදුරදුන් තමන් හඳුන්වා දෙන්නේ "තමා ලොවේම ඉපදී එහිම වැඩී එහෙත් ලොවේ නොගැලී සිටින බවත්, එනිසා තමා බුද්ධ නම් වන බවත්ය".[37] එසේම මහාපරිනිබ්බාන සූත්‍රයේදී ප්‍රකට වන්නේ උන්වහන්සේද සාමාන්‍ය මිනිසෙකු සේ ජරාවට, රෝග පීඩාදියට පත්වූ ආකාරයයි. නුවණින් ඉතා උසස් ඥානයක් ලබා තිබුනද සිරුරින් උන්වහන්සේ මිනිසෙකි. "ආනන්ද ක්ලාන්ත ගතියයි, සඟල සිවුර සිව්ගුණ කොට තමා ආසනයක් පනවන්න, හිඳගැනීමට අවශ්‍යයයි... ආනන්ද මට පිපාසයි, පැන් ටිකක් ගෙන එන්න".[38] එසේම සංයුක්ත නිකායේ ජරා සූත්‍රය වැනි සූත්‍ර ගණනාවකදීම බුදුරදුන්ගේ ස්විභාවික මානුෂික තත්වය ප්‍රකට වේ.



මේ අයුරින් විමසා බලන විට පැහැදිලි වන්නේ බුද්ධත්වය හෝ එම සංකල්පය අතීත බුදුවරුන්ගේ මාර්ගයට සම්බන්ධ කරනවාට වඩා ක්‍රි.පූ හය වැනි සියවසේ ලෝකයේ සිදු වූ චින්තන විප්ලවයේ අග්‍ර ඵලයක් ලෙස බිහිවූ ආකාරයකි. බොහෝ සූත්‍රවල නිරූපනය වන්නේ පෙර බුදුවරුන්ට සම්බන්ධයක් නැති ශාස්තෘවරයෙකුගේ ස්වරූපයකි. එයට හොඳ නිදසුන් ත්‍රිපිටකයෙන් සපයා ගත හැක. මුල්ම ත්‍රිපිටක නිකාය ග්‍රන්ථ වන දීඝනිකායේ මහාපදාන සූත්‍රයේ සඳහන් වන්නේ බුදුවරුන් හය දෙනෙක් ගැන පමණි. විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගමන, කස්සප යන බුදුවරුන් ගැන හා උන්වහන්සේලාගේ දෙමාපිය, ශ්‍රාවක ශ්‍රාවිකාවන් ගැන මෙහි සඳහන් කර තිබේ.[39] එහෙත් පසුකාලීනව බුදුවරුන් 27 නමකගේ නම් සඳහන් කිරීමක් දැක ගත හැක්කේ ත්‍රිපිටක සාහිත්‍යයේ පසුකාලීනව රචනා වූ බුද්ධවංශයේය. ගෞතම බුදුරදුන්ට පෙර විසූ විසිහතරවෙනියාගෙන් පළමුව ගෞතම බුදුන් විවරණ ගත් බව මෙහි සඳහන් වේ. මේ පිළිබඳව අදහස් දක්වන එඩ්වර්ඩ් ජේ. තෝමස් මහතා පවසන්නේ මෙම බුදුවරුන් පිළිබඳ අදහස බෞද්ධ සාහිත්‍යයට ඇතුළු වන්නට ඇත්තේ ජෛන සාහිත්‍යයෙන් බවයි. ජෛන මහාවීරට පෙර විසූ නායකයන් විසිතුන්දෙනෙකු ගැන සඳහන් වේ. 23 වැනියා වන පාර්ශව නැමැත්තා ඓතිහාසික පුද්ගලයෙකු වන නිසා ඒ ඔස්සේ ජෛනවරු තම අතීත නායකවරු නිර්මාණය කර ගත්හ. මේ දෙදෙනාම බුදුරදුන්ට පෙර විසූ අය නිසා ඒ ඔස්සේ තම අතීත බුදුවරු ගැන සිතන්නට ඇත.[40] කෙසේ වුවද ථෙරවාදයේ මේ ආකාරයෙන් බුද්ධ සංකල්පය සටහන් කරත්දී මහායාන ඇතුළු අනෙකුත් සම්ප්‍රදායයන් තුළ බුද්ධ සංකල්පය විකාශය වූයේ හාත්පසින්ම වෙනස් ආකාරයකටය. විශේෂයෙන්ම මහායාන සම්ප්‍රදායේ බුදුරදුන්ගේ ලෝකෝත්තර ස්වභාවය සාතිශය ලෙස උලුප්පා දක්වා තිබේ.

## මහායාන බුද්ධ සංකල්පය

ථෙරවාදයට අමතරව ''බුද්ධ'' සංකල්පය පිළිබඳව අදහස් ඉදිරිපත් කළ අය අතර මහායාන සම්ප්‍රදායට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ථෙරවාදීන්ට අනුව බුද්ධ විෂය අචින්ත්‍යය. එය පිළිබඳව සෙවීමට යාමෙන් සිදුවන්නේ හුදෙක් උමතු බවට හෝ වෙහෙසට පත් වීම පමණකි.[41] එසේ හෙයින් සදහම් මාර්ගයට පිවිසීමට ප්‍රමාණවත් යැයි ථෙරවාදීහු කල්පනා කළහ. මහායානිකයෝ එපමණකින් සෑහීමකට පත් නොවූහ. ඔවුන් බුදුරදුන් පිළිතුරු දීමෙන් වැලකී සිටි ප්‍රශ්නද දාර්ශනිකව විසඳීමට උත්සාහ ගත්හ. විශේෂයෙන් හින්දු සමයේ බලපෑම මේ සඳහා තදින් ලැබුණි. ථෙරවාදීන් බුදුරදුන් මනුෂ්‍යත්වයකින් හෙබි උත්තරීතර මිනිසෙකු ලෙස පිළිගත්තද මහායාන සම්ප්‍රදායේ දී උත්සාහ ගෙන ඇත්තේ බුදුන් අතිමානුෂීය තත්වයට පත්කිරීමටය. ඔවුන්ගේ ඉගැන්වීම් වලට අනුව බුදුරදුන්ට කාය තුනකි.

1. ධර්මකාය
2. සම්භෝග කාය
3. නිර්මාණකාය යනු එම ත්‍රිකායයි.

''ධර්මකාය නම් බුදුවරුන්ගේ පරමාර්ථික ශරීරයයි. නිර්මාණකාය, සම්භෝගකායයෝ බුදුවරුන්ට වෙනස් වෙනස් අයුරින් පිහිටති. එහෙත් ධර්මකාය සියලු බුදුවරුන්ට එක සමානය. එහි වෙනසක් නැත. සම්භෝගකාය සහ නිර්මාණකාය ද ධර්මකාය පිණිස පවතී. ඒ සමගම බැඳී ඇත්තේය. ධර්මකාය ශබ්ද ගෝචර නොවේ හෙවත් ශබ්දයකින් පැවසිය නොහැකිය. එබැවින් අනිර්වචනීයය.[42]''

''මිනිස් ඇසින් නොබැලිය හැකි සියුම් වූ අද්භූත නිමිති පහළ කරන කාය සම්භෝගකාය නම් වේ. ද්වාත්‍රිංශත්වර මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සහ අශීත්‍යනුව්‍යඤ්ජනයන්ගෙන් යුක්ත වූයේ



සම්භෝගකායයි.''[43] මෙම කාය ඉතාම සියුම් බව සඳහන් වේ. බෝසත්වරුන්ට හා බුදුවරුන්ට මෙම සම්භෝගකාය ඇත. බුදුරදුන් ගිජ්ඣකූට පර්වත මුදුනේ දී මහායාන ධර්ම දේශනා කර ඇත්තේ මෙම සම්භෝගකායෙනි. මෙම ශරීරය ඉතාමත් දීප්තිමත්ය. එහි එක් සිදුරකින් නික්මෙන ආලෝක ධාරාවකින් අප්‍රමාණ සක්වලවල් ආලෝකමත් වන බව සඳහන් වේ. සම්භෝගකාය ප්‍රීතිය භුක්ති විඳින ශරීරයකි. අකනිටා බඹලොවේ දී බුදුවරුන් බෝධිසත්ව වරුන්ට තමාම ප්‍රකාශයට පත් කරනුයේ මේ සම්භෝගකායෙනි.

බුදුවරුන් මනුෂ්‍ය ලෝකයේ පෙනී සිටින්නේ නිර්මාණකායෙනි. ශාක්‍ය මුනි ගෞතම යනු අප දන්නා ඓතිහාසික බුදුන්ගේ නිර්මාණකායයි. බුදුහු නිර්මාණ ස්වරූපයෙන් මිනිසුන් අතර පෙනී සිටිමින් සත්වයන්ගේ නිවීම පිණිස ධර්මය දේශනා කරති. මෙම නිර්මාණ කාය මවා ගත හැක්කේ බුදුවරුන්ට පමණි. තථාගතවරයෙකු විසින් කළයුතු දෑ කිරීමට මනුෂ්‍ය ශරීරයකින් නොහැකි නිසා තථාගතයෝ නිර්මාණ වේශය මවාගනිතියි ලංකාවතාර සූත්‍රයේ සඳහන් වේ. මෙම නිර්මාණකායේ පරමාර්ථය නම් පරෝපකාර සාධනයයි.[44]

මහායානයේ සඳහන් වන ආකාරයට දස භූමි අනුත්තර පූජා විධි හා දස ප්‍රණිධාන, ෂට් පාරමිතා ආදිය පිළිබඳ ගවේශනය කිරීමෙන් හා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බුද්ධත්වයට පත් වේ. ප්‍රාථමික වශයෙන් පිරියයුතු ගුණ ධර්ම ප්‍රගුණ කිරීමෙන් ධර්ම මේඝා භූමියෙන් නිර්වාණ ක්ෂේම භූමියට පැමිණේ. බුදුවරු වැඩ වෙසෙන්නේ එම නිවන් නැමැති ලෝකයේය. ලෝවැසියා පාපයෙන් වැසී යන විට එම බුදුවරු මෙලොවට වැඩම කරති. එවැනි බුදුවරු පස්නමක් ඇත. වෛරෝචන, අක්ෂෝභ්‍ය, රත්නසම්භව, අමිතාභ හා අමෝඝ සිද්ධි යනුවෙනි. ථෙරවාදයේ සඳහන් වන බුදුවරු අතීතයට සම්බන්ධය. එහෙත් මහායානයේ බුදුවරු තුන්කාලයේම සිටී. බෝධිසත්වයන් සේම බුදුවරුන් ද අසංඛ්‍ය ප්‍රමාණයක් සිටී. ඔවුහු මුලු සක්වලම ආලෝකමත්

කරමින් සුඛාවතියේ වැඩ සිටිති. අසංඛ්‍ය ප්‍රමාණයක් බුදුවරු වැඩ සිටියත් ඉතා වැදගත් වන්නේ මුලින් සඳහන් කළ පස් දෙනාය.[45]

මහායාන දර්ශනයට අනුව බුදුවරු සදාකාලික වෙති. අප අතර ජීවමානව වැඩ වෙසෙති. මේ සියලු බුදුවරයින්ගේම ප්‍රමුඛයා ආදි බුද්ධය. මෙම ආදි බුද්ධ විසින් කලින් කල නොයෙක් බුදුවරු නිර්මාණය කෙරෙති. ආදි බුදුන්ගේ කාර්යය එයයි. අමිතාභ බුදුන්ගෙන් සම්පූර්ණයෙන්ම ධර්මකාය නිරූපණය කෙරෙයි. පරහිතකාමී විමුක්තිදායක වූ අමිතායුෂ් සම්භෝගකාය ප්‍රකට කරති. මෙම පරහිතකාමියාගේම මනුෂ්‍ය ස්වරූපය නිර්මාණකායයි. එය ශාක්‍යමුනිවරයන් කෙරෙන් ප්‍රකට වේ.

"බුදුහු බුද්ධත්වයත් සමඟ නිවන් ප්‍රත්‍යක්ෂ කර ගනිති. නිවන සාංසාරික නොවේ. භවයට සම්බන්ධ සංස්කාර භාවයක්ද නොවේ. භව හා (සසර) භාව (සංස්කාර) යන්ගේ නිරෝධය නිවන නොවේ. මානුෂික ස්වරූපයක් වූ නිර්මාණකාය තේරුම්ගෙන අභෞතික වූ ස්වරූපයෙන් බුදුහු සුඛාවතියෙහි වැඩ වෙසෙති. ඒ සුඛාවතිය දිව්‍යමය ය. අභෞතිකය."[46]

මහායාන වෛපුල්‍ය සූත්‍රයේ සසරින් එතෙර වීමට එකම යානයක් පමණක් ඇතිබව සඳහන් වේ. එය බුද්ධ යානයයි.

"එකමෙවාහං ශාරිපුත්‍ර යානමාරභ්‍ය සත්වානං ධර්මං දේශයාමි යදිදං බුද්ධ යානං"

ශාරිපුත්‍රය බුද්ධ යානය නම් වූ එකම යානය අරමුණු කොට මම සත්වයන්ට දහම් දෙසමි.

"ත්‍රෛධාතුකෙ ශ්‍රෙෂ්ඨවිශිෂ්ඨ යානං සුගතෙහි වර්ණිතම්"

බුදුරජාණන් වහන්සේ වර්ණනා කරන ලද බුද්ධ යානය ලෝකයෙහි උසස්ම යානය වේ.

එකංහි යානං ද්විතීයං න විද්‍යතෙ
තෘතීයං නෙවාස්ති කදාචි ලොකෙ.[47]



"එකම යානයක් විනා දෙවැන්නක් නොමැත. තෙවැන්නක් නම් කිසිවිට ලෝකයේ නොමැත්තේමය" යනුවෙන් සද්ධර්මපුණ්ඩරිකයෙහි සඳහන් වේ. මෙසේ බුද්ධ සංකල්පය පිළිබඳ මහායාන සම්ප්‍රදායේ අදහස් ලලිත විස්තරයේ, මහායාන සූත්‍රාලංකාරය, අෂ්ටසහශ්‍රිකා ප්‍රඥාපාරමිතාව, ලංකාවතාර සූත්‍රය, සද්ධර්මපුණ්ඩරිකය, වැනි ග්‍රන්ථවල සඳහන් වේ.

මේ ආකාරයට මහායාන සම්ප්‍රදායේ බුද්ධ සංකල්පය ඇති වීම සඳහාත් විශේෂයෙන් ත්‍රිකාය සිද්ධාන්ත කෙරෙහිත් මුල් බුදුසමයේ යම් යම් ඉගැන්වීම් බලපෑවේය. දී.නි. මහාපරිබ්බාන සූත්‍රයේ දී "ආනන්දය, මා විසින් දේශනා කරන ලද ධර්මයද පනවන ලද විනයද මාගේ ඇවෑමෙන් තොපගේ ශාස්තෘ වන්නේය."[48] යනුවෙන් ආනන්ද හිමි අරහයා කරන ලද ප්‍රකාශය ද සංයුක්ත නිකායේදී යමෙක් ධර්මය දකීද හෙතෙම තමන් දක්නා බවත්[49] යමෙක් තමන් දකීනම් හෙතෙම ධර්මය දක්නා බවත් වක්කලී හිමිට කළ දේශනාව ද ධර්මකාය සංකල්පය පැන නැගීමට හේතුවන්නට ඇතැයි මහායාන පඬිවරයෙකු වූ සුසුකි පවසයි.

"ආනන්ද මම සියගණන් ක්ෂත්‍රිය පිරිස්, බමුණු පිරිස්, ගෘහපති පිරිස්, ශ්‍රමණ පිරිස්, චාතුම්මහාරාජික පිරිස්, තාවතිංස පිරිස්, මාර පිරිස්, බ්‍රහ්ම පිරිස් වෙත එළඹෙන බව දනිමි. මා විසින් එහි සිටියේ වෙයි. කථාබස් කළේ වෙයි. එහි ඔවුන්ගේ පැහැය යම් බඳුවේද මගේ පැහැයද එබඳු වේ. ඔවුන්ගේ කටහඬ යම් බඳු වේද මාගේ කටහඬද එබඳු වේ. දැහැමි කථාවෙන් කරුණු දක්වමි. සමාදන් කරවමි. උත්තේජනය කරවමි. සතුටු කරවමි. එසේ දහම් දෙසන මා දෙවියෙක් ද මිනිසෙක් ද කියා නොදනිති. එසේ දහම් දෙසන මා අතුරුදන් වූවද කිසිවෙක් මා දෙවියෙක් ද මිනිසෙක් දැයි නොදනිති."[50]

දී.නි. මහාපරිනිබ්බාන සූත්‍රයේ සඳහන්වන මෙම පාඨයෙන් බුදුරදුන්, වරෙක නිර්මාණ කායෙනුත් වරෙක සම්භෝග

කායෙනුත් ධර්මය දේශනා කරන්නට ඇති බවට සිතිය හැක. මෙවැනි ත්‍රිපිටකයේ දක්නට ලැබෙන යම් යම් සාධක ඔස්සේ මහායාන ත්‍රිකාය සංකල්පයට පදනම වැටෙන්නට ඇතැයි සිතිය හැක. එසේම මහාසාංඝිකයන්ගේ ලෝකෝත්තර වාදය ද ත්‍රිකාය සංකල්ප බිහිවීම සඳහා ඍජුවම බලපා තිබේ. මහා සාංඝිකයෝ බුදුන් මිනිසෙකු ලෙස නොපිළිගනිති.. උන්වහන්සේට ලෞකික මිනිස් සිරුරක් නොමැති බවත් කැමැත්ත අනුව මින්ස් සිරුරක් දරන බවත් සඳහන් කරති. හින්දු සමයේ බලපෑම ද යම්තාක් දුරට ලැබී ඇතැයි සිතිය හැක. හින්දූන්ගේ ත්‍රිමූර්තිය, විශ්ණුගේ දශ අවතාරය වැනි සංකල්ප ද වේදාන්ත දර්ශනයේ බ්‍රහ්මට යොදන සියලු විශේෂණ ධර්මකායට යෙදී ඇත. වේදාන්ත දර්ශනයේ ඊශ්වර තත්වය සම්භෝග කායට සම්බන්ධය. ලෝකානුශාසනයට ඊශ්වර මූර්තිය ගන්නා සේ ධර්මකාය ද මහජනයාට ධර්මෝපදේශ දීම සඳහා සම්භෝග කාය ද දරන බව රාධකිෂ්ණන් මත ප්‍රකාශ කර තිබේ.[51]

## සමෝධානය

ලෝකය තුළ විවිධ යුගවලදී විවධ පුරුෂෝත්තමයන් බිහිවී ඇත. ඔවුන් ලෝකය තුළ විවිධ අන්දමේ විපර්යාස සිදුකර තිබේ. සමහරුන් ආධ්‍යාත්මය පෝෂණය කළ අතර සමහරු භෞතික සම්පත් ළඟාකර දුන්හ. අසාමාන්‍ය බුද්ධියකින් හා චින්තනයකින් යුත් මෙවැනි පුරුෂයන්ගේ ක්‍රියාකාරකම් අදහාගැනීමට නොහැකි බොහෝ දෙනා ඔවුන් අතිමානුෂිය පුද්ගලයන් වශයෙන් පසුකාලීනව හැඳින්වීමට උත්සහ ගත්හ. බුදුරජාණන් වහන්සේ නමින් අපි හඳුන්වන මේ අද්විතීය පුරුෂයා ද එවැන්නෙකි. මිනිස් මාපිය යුවලකට දාව මිනිසෙකු ලෙස මෙලොව බිහිවී සාමාන්‍ය මිනිසෙකු ලෙස මෙලොව පැවැත්මට යටත්ව ජීවත් වූහ. එහෙත් එතුමාට සාමාන්‍ය මිනිසා සතුටු වන අඹු දරු, ධන, ධාන්‍ය වලින් සතුටු වී එයින් සැහීමකට පත්වීමට නොහැකි විය. එයින් ලැබෙන සතුටට වඩා දුක් මහත් බව වටහා



ගත් එතුමෝ අසාමාන්‍ය චින්තනයක් ගොඩනැගීමට උත්සාහ ගත්හ. එය උඩුගං බලා පිහිනීමක් වැනි විය. එහෙත් අවසානයේ ජය එතුමාට හිමි විය. අවේදයිත සුඛය එතුමෝ අවබෝධ කරගත්හ. එය ලබාගන්නා ආකාරය ද හෙළි කළහ. ඒ තුළින් අප්‍රමාණ සත්වයින් තම සුඛයට නතු කළහ.

කල්යත්ම මෙම සාමාන්‍ය මිනිසාගේ අසාමාන්‍ය තත්වය දෙස බැලූ බොහෝ දෙනා විශ්මයට පත්වූහ. යුගයන්ට ගැලපෙන අයුරින් එතුමා නවීකරණය කළහ. අවසානයේ දී ගූඪ වස්තුවක් බවට පත් කළහ. එහෙත් නිකායන්ගේ ගූඪ සංකල්ප නැමති තිර පට ඉවත් කර බැලූ විට බුදුරදුන් යනු සැබෑ මිනිසත්කම වටහාගෙන දූෂිත වී තිබූ මිනිස් සිත පිරිසිදු කළ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක් බව පෙනීයයි.

බෝධිසත්ව සංකල්පය හරහා ත්‍රිකාය සංකල්පය තෙක් විකාශය වූ බුද්ධ සංකල්පය බෝහෝ දුරට වර්ධනය වූයේ ස්වකීය දෘෂ්ටි අනුව තම ඥානයෙන් ධර්මය විග්‍රහ කිරීම යාමෙනි. බුදුරදුන්ගේ සැබෑ දර්ශනය සියයට සියයක් නිවැරදිව දැක ගැනිමට අපට හැකියාවක් ඇත්ද යන්න විමසා බැලිය යුතුය. අප සතුව ඇත්තේ වසර දෙදහසකටත් වඩා පැරණි යුගයක පටන් මුඛ මාර්ගයෙන් පැමිණ ග්‍රන්තාරූඪ වූ ධර්ම කොට්ඨාශයකි. එය ද කාලානුරූපව විවිධ විපර්යාසයන්ට භාජනය වී කෙසේ හෝ තම ප්‍රතිරූපය බොහෝ දුරට ආරක්ෂා කරගෙන තිබේ. එසේ ආරක්ෂා වූ දර්ශනයක් ථෙරවාදයේ දී දැකිය හැක. එයට ද යම් යම් මතවාද ඇතුලත් වී ඇතිබවට සැක කළ යුතු තැන් නැත්තේ නොවේ. කෙසේ වුව ද බෝධිසත්ව හා බුද්ධ යනු අමුතුම මිනිස් ස්වභාවය ඉක්මවූ පිරිසක් නොවේ. ඒ බව නිකායිකයන්ගේ ගූඪ දර්ශනයන් විනිවිද ගොස් බැලූ විට පැහැදිලිවේ. ඒ තුළින් සැබෑ බුදුන් අපට මුණගැසේ.

## ආන්තික සටහන්

1. <u>මජ්ඣිම නිකාය 1.</u> මහාතණ්හාසංඛය සූත්‍රය, බු.ජ.ත්‍රි. 602 පිටුව.

2. <u>පරාජිකා පාලි,</u> පඨම සංඝභේද ශික්‍ෂාව, බු.ජ.ත්‍රි. 448 පිටුව.

3. සාසනරතන හිමි, එම්., <u>ලක්දිව මහායාන අදහස්,</u> විසිදුණු ප්‍රකාශකයෝ, 471, වැවපාර, බොරලැස්ගමුව, 1999, 211 පිටුව.

4. එම, 211 පිටුව.

5. එම

6. "Bodhi from the root *budh* to be awake means awakening or enlightenment and *sattva* derived from sant…pali term may be derived from *bodhi* and *satta* one who attached to or desires to gain Enlightenment...In original *pali* Buddhism the term *bodhisatta* is used or less to designate *Gotama* Buddha prior to his Enlightenment. The concept of *bodhisattva,* along with that of Buddha and of *catravatin* was in vogue in India even before the appearance of Gavtama Buddha" <u>Encyclopedia of Buddhism</u>", p.224.

7. සාරදමහාස්ථවිර, වේරගොඩ, පරි., <u>බුදුදහම සහ බුදුරජාණන් වහන්සේ,</u> සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය, අංක 01, සිංගප්පූරුව, 2001, පිටුව 361.

8. ''පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි'' 'ගෝතම සූත්‍රය, <u>සං.නි. II,</u> බු.ජ.ත්‍රි., 16 පිටුව.

9. ''අථකො භික්ඛවෙ බොධිසත්තො තුසිතකායා චවිත්‍වා සතො සම්පජානො මාතු කුච්ජිං ඔක්කමි. අයමෙත්‍ථ ධම්මතා'' මහාපදාන සූත්‍රය, <u>දී.නි. II,</u> බු.ජ.ත්‍රි. 180 පිටුව.

10. ''යදා බොධිසත්තො මාතු කුච්ජිං ඔක්කමන්තො හොති චත්තාරො නං දෙව පුත්තා චතුද්දිසං රක්ඛාය උපගච්ඡන්ති'' මහාපදාන සූත්‍රය, <u>දී.නි. II,</u> බු.ජ.ත්‍රි. 180 පිටුව.

11. ''පස්සථ ඉමං තාපසං - ජටිලං උග්ගතාපනං
අපරිමෙයො ඉතො කපෙප - බුද්ධො ලොකෙ භවිස්සති,'' <u>බුද්ධවංශය,</u> සුමේධ කථා, 60 ගාථාව, බු.ජ.ත්‍රි. 30 පිටුව.

12. ''මනුස්සත්තං ලිඞගසම්පත්ති - හෙතු සත්‍ථාරදස්සනං
පබ්බජජා ගුණසම්පත්ති - අධිකාරොච ඡන්දතා
අට්ඨධමමසමොධානා - අභිනීහාරො සමිජ්ඣති,'' <u>බුද්ධවංශය,</u> සුමේධ කථා, 58 ගාථාව, බු.ජ.ත්‍රි. 32 පිටුව.



13. ''ඉදං සුත්‍වාන වචනං - අසමස්ස මහෙසිනො
ආමොදිතා නරමරූ - බුද්ධබීජංකුරො අයං,'' <u>බුද්ධවංශය,</u> සුමේධ කථා, 70 ගාථාව, බු.ජ.ත්‍රි. 32 පිටුව.

14. ''දස පාරමී තයා ධීර - කිදිසා ලෝකනායක
කථං උපපාරමී පුණ්ණා - පරමත්‍ථ පාරමී කථං,'' <u>බුද්ධවංශය,</u> රතනචංකමණ කාණ්ඩය, 77 ගාථාව, බු.ජ.ත්‍රි. 18 පිටුව.

15. මහාපදාන සූත්‍රය, <u>දී.නි. II,</u> බු.ජ.ත්‍රි. 180 - 200 පිටු.

16. සේනානායක, කරුණා, පරි. <u>බෞද්ධ චින්තාවේ ඉතිහාසය,</u> ඇම්.ඩී ගුණසේන සහ සමාගම කොළඹ 11 1966 225 පිටුව.

17. රාහුල. ඒ., මහානාම, බී., <u>මහායානය,</u> දීපානි ප්‍රකාශකයෝ, හයිලෙවෙල් පාර, ගංගොඩවිල, නුගේගොඩ, 1970, පූර්විකාව.

18. එම.

19. සාසනරතන හිමි, එම්., එම, 1999, 212 පිටුව.

20. සාසනරත හිමි, එම්., එම, 1999, 216 පිටුව.

21. එම, 217 පිටුව.

22. රාහුල, ඒ., මහානාම, බී., එම, 1970, 93 පිටුව.

23. රාහුල, ඒ., මහානාම, බී., එම, 1970, 93 පිටුව. 61-94 පිටු.

24. සාසනරතන හිමි, එම්., එම, 1999, 218 පිටුව.

25. රාහුල, ඒ., මහානාම, බී., 1970, 95 පිටුව,

26. "Buddha a generic name an appellative - but not a proper name; given to one who has attained the truth one, who has attained Enlightenment; The word is the passive past participle derived from the root *budh* means to wake to wake up to perceive to learn to understand; Chinese the usual form is Fo and in Japanese *Butusu* or *Hotoku.* But often it is rendered in to Chinese as *chiao - chē* Tibetan as Sans - Rgyas in European Languages as the Awakened the Enlightened one; The earlier texts mention two kind of Buddhas viz *Pacceka* Buddhas and *sammāsambuddhas.* The Pali commentaries mention four classes of *Buddhas; Sabbaññubuddha Paccekabuddha Catusaccabuddha* and *Buhussuta* Buddha. All learned men are called *Bahussutabuddhas* and all Arahantas *Catusaccabuddhas* those who have realized the four truths. A *Paccekabuddha* practices the ten perfections which lead to

Enlightenment for two *asaṇkheyyas* and hundred thousand *kappas*. A *Sabbaññubuddha* practices them for one hundred thousand *kappas* and four or eight or sixteen *asaṇkheyyas* as the case may be; in the latest stages of the Mahāyāna other Buddhas are mentioned *Dhyānibuddha* together with *Adibuddha*." Encyclopaedia of Buddhism, p.357

27. බුජ්ඣිතා සච්චානීති බුද්ධා. බොධෙතො පජායාති බුද්ධා., පටිසම්භිදාමග්ගය, බු.ජ.ත්‍රි. 328 පිටුව.

28. "සම්බාධො ඝරාවාසො රජොපථො අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං... සුසුකාළ කෙසො භද්‍රෙන යොබ්බනේන සමන්නාගතො මාතාපිතූනං අස්සුමුඛානං රුදන්තානං කේසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං" සංගාරව සූත්‍රය, ම.නි. II, බු.ජ.ත්‍රි. 740 පිටුව.

29. එම, 742 පිටුව.

30. එම, 754 පිටුව.

31. එම, නි. 759 පිටුව.

32. සං.නි. II, නගර සූත්‍රය, බු.ජ.ත්‍රි. 162 පිටුව.

33. "පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමඤ්ඤෙව ධම්මං අභිඤ්ඤාය දිට්ඨධම්මාභිඤ්ඤාවොසානපාරමිප්පත්තා ආදි බ්‍රහ්මචරියං පටිජානාති. තෙසාහමස්මි" ම.නි. II, සංගාරව සූත්‍රය බු.ජ.ත්‍රි. 759 පිටුව.

34. ම.නි. 3

35. "තෙවිජ්ජො සමණො ගොතමොති" තෙවිජ්ජක වච්ඡගොත්ත සූත්‍රය, ම.නි. II, බු.ජ.ත්‍රි. 254 පිටුව.

36. ,නත්ථි වො බ්‍රාහ්මණ එක භික්ඛුවපි තෙහි ධම්මෙහි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං සමන්නාගතො යෙහි ධම්මෙහි සමන්නාගතො සො භගවා අරහං සම්මා සම්බුද්ධො" ගොපක මොග්ගල්ලාන සූත්‍රය, ම.නි. III, බු.ජ.මු, 100 පිටුව.

37. "අහං බ්‍රාහ්මණ ලොකෙ ජාතො ලොකෙ සංවද්ධො ලොකං අභිභුය්‍ය විහරාමි. අනුප්පලිත්තො ලොකෙන බුද්ධොති බ්‍රාහ්මණ මං ධාරෙහි" දෝණ සූත්‍රය, අං. නි. II, බු.ජ.ත්‍රි. 78 පිටුව.

38. "ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද චතුග්ගුණං සංඝාටිං පඤ්ඤාපේහි කිලන්තොස්මි ආනන්ද නිසීදිස්සාමි" මහාපරිනිබ්බාණ සූත්‍රය, දී. නි. II, බු.ජ.ත්‍රි., 200 පිටුව.



39. මහාපදාන සූත්‍රය, දී. නි. II, බු.ජ.ත්‍රි.

40. සේනානායක, කරුණා, පරි., එම, 252-255 පිටු.

41. "බුද්ධානං භික්ඛවේ බුද්ධවිසයො අචින්තෙය්‍යො න චින්තෙතබ්බො යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස" අචින්තේය සූත්‍රය, අං.නි. II, බු.ජ.ත්‍රි., 150 පිටුව.

42. සාසනරතන හිමි. එම්., එම, 198-199 පිටු.

43. එම, 197 පිටුව.

44. එම, 197 පටුව.

45. රාහුල, ඒ., මහානාම, බී., එම, 69 පිටුව.

46. එම, 75 පිටුව.

47. එම, 20 පිටුව.

48. "යො වො ආනන්ද මයා ධම්මොච විනයොච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා" මහාපරිනිබ්බාණ සූත්‍රය. දී.නි. II, මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.ත්‍රි.

49. "යො බො වක්කලි ධම්මං පස්සති සො මං පස්සති. යො මං පස්සති සො ධම්මං පස්සති"

50. අභිජානාමි ඛො පනාහං ආනන්ද අනෙකසතං ඛත්තියපරිසං බ්‍රාහ්මණ පරිසං... ගහපතිපරිසං... චාතුම්මහාරාජිකං පරිසං...තාවතිංසපරිසං... මාරපරිසං... බ්‍රහ්මපරිසං... උපසංකමිතා තත්‍රාපි මයා සන්නිසින්නපුබ්බං චෙව සල්ලපිතපුබ්බං ච සාකච්ඡා ච සමාපජ්ජිත පුබ්බා තත්ථ යාදිසකො තෙසං වණ්ණො හොති. තාදිසකො මයහං වණ්ණො හොති. යාදිසකො තෙසං සරො හොති තාදිසකො මයහං සරො හොති. ධම්මියා ච කථාය සන්දස්සෙමි සමාදපෙමි සමුත්තෙජෙමි සංපහංසෙමි. භාසමානං ච මං න ජාන්ති කොනු ඛො අයං භාසති. දෙවො වා මනුස්සො වා ති ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සංපහංසෙත්වා අන්තරධායාමි. අන්තරහිතං මං න ජානන්ති, කො නු ඛො අයං අන්තරහිතො දේවො වා මනුස්සොවාති" මහාපරිනිබ්බාණ සූත්‍රය, දී.නි. II, බු.ජ.ත්‍රි. 170 පිටුව.

51. රාහුල, ඒ., මහානාම, බී., එම, 98 පිටුව.